ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2080/30 – 2018 ජූලි 17 වැනි අඟහරුවාදා – 2018.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/COM/01/E/2014/86.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.01.12 දිනැති හා අංක 1949/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2015.12.31 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය (සේවකයින් 23 ක් වෙනුවෙන්) හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, බ්‍රේබෲක් පෙදෙස, අංක 75, හේමාස් මන්දිරය, 05 වන මහල හි පිහිටි සෙරන්ඩිබ් ලෙෂර් මැනේජ්මන්ට් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.03.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 28108 – 09 (2018/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය : IR/COM/01/E/2014/86.

**කාර්මික අධිකරණයේදී ය.**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම. (සේවකයින් 23 ක් වෙනුවෙන්)

*සහ*

නඩු අංක ඒ - 3615

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සෙරන්ඩිබ් ලෙෂර් මැනේජ්මන්ට් ලිමිටඩ්, 05 වන මහල, හේමාස් මන්දිරය, අංක 75, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02.

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධවයි.

**ප්‍රදානයයි.**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මහතා විසින් තමා වෙත පැවරී ඇති බලතල අනුව වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කර මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ -

"සෙරන්ඩිබ් ලෙෂර් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනයට අයත් ඩොල්ෆින් හෝටලයේ 2014 වර්ෂයේ කාර්යසාධනය මැනීමේදී පහත නම් සඳහන් සේවකයින් 23 දෙනාගේ මුල් ශ්‍රේණිගත කිරීමේ මට්ටම අවසන් ශ්‍රේණිගත කිරීමේදී පහළ දැමීම හේතුවෙන් යම් අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

01. ආර්. ඒ. ඩී. බිමල් බුද්ධජි
02. වයි. යූ. සෙල්වරත්නම්
03. එස්. ශකිලා රසාංගිකා ජයවර්ධන
04. එස්. ඩී. එරංග කැන්දිදාස්
05. ආර්. එච්. චතු විජේසිංහ
06. ආර්. එම්. ගුණතිලක
07. ටී. එම්. එස්. ඩී. තෙන්නකෝන්
08. එච්. එම්. ලලිත් ජැක්සන්
09. එච්. රාධිකා ප්‍රියදර්ශනී පීරිස්
10. ජේ. එම්. ජයන්ත ජයසූරිය
11. රනිල් කුලතුංග
12. ඩබ්. සමන්ත විජේසේකර
13. එම්. එල්. සිරිල් ෆොන්සේකා
14. ඩබ්. ලාල් ප්‍රනාන්දු
15. එල්. ටී. සී. ප්‍රනාන්දු
16. ඒ. එම්. රුවන් කුමාර
17. ජී. ජී. එස්. ලලී කුමාර
18. ගමගේ ජී. එන්. අනුරාධ
19. විපුල එල්. ගමගෙදර
20. ඩී. පී. අයි. නිශාන්ත
21. කේ. එම්. උදය සංජීව
22. එම්. ආර්. ලසන්ත
23. ඩබ්. සමරකෝන් බණ්ඩා

දෙපාර්ශවය විසින් ඔවුන්ගේ ප්‍රකාශ සහ ප්‍රතිප්‍රකාශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පරීක්ෂණය 2016.06.27 වැනි දින ආරම්භ කිරීමට දෙපාර්ශවයේ එකඟත්වයෙන් එදින නඩුව විභාගයට ගත් අවස්ථාවේ දී මෙම පරීක්ෂණයේ වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් කලින් පෙනී සිටි නීතිඥ අදිල් කාසීම් මහතා අසනීප තත්ත්වයක සිටි නිසා ඒ මහතාට පරීක්ෂණය සඳහා පැමිණීමේ අපහසුතාවය හේතු කොටගෙන පරීක්ෂණය දෙපාර්ශවයේ එකඟත්වයෙන් 2016.08.12 දින ප.ව. 2.00 ට කල්තබන ලදී. එදින දෙපාර්ශවයේම නීතිඥවරුන් පෙනී සිටී අතර එදින සාක්ෂි දීමට නියමිතව සිටි වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු පැමිණ නැති බවත් ඊළඟ දිනයේ දී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ඩොල්ෆින් හෝටලයේ සමාගමේ කළමනාකරු සුරංග වැවේගෙදර බැවින් ඊට අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලුම් කළ නිසා එදින පෙනී සිටීමට සමාගමේ ඩොල්ෆින් හෝටලයේ මානව සම්පත් කළමනාකරු කැඳවීමට අවස්ථාවක් ලබාදෙමින් එදින එම සාක්ෂිකරු නොපැමිණෙන්නේ වෙනත් සාක්ෂිකරුවෙකු එදින වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් කැඳවීමට ද බේරුම්කරණය එම පාර්ශවයට දැනුම් දෙන ලදී. ඉල්ලුම්කාර පාර්ශවයේ ද එකඟත්වයෙන් පරීක්ෂණය 2016.09.21 දින කැඳවීමට බේරුම්කරණය විසින් අවසර ලබාදෙන ලදී. මේ දිනය අවසානයේ දී සමාගම විසින් සේවකයින්ගේ පඩි වැඩිවීම සඳහා තීරණය කර ඇති බැවින් ඉල්ලුම්කාර පාර්ශවයද ඊට එකඟත්වයක් දැක්වීම නිසා ඒ ගැන දීර්ඝ ලෙස සාකච්ඡා කොට සාධාරණ තීරණයක් ගැනීම සඳහා වැඩිදුරටත් සාකච්ඡා කිරීමට පරීක්ෂණය 2016.09.30 දින ප. ව. 2.30ට කල් තබන ලදී.

2016.09.21න් පසු වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂි මෙහෙයවීම කෙරෙහි මා සෑහීමකට පත් නොවූ අතර එදින වගඋත්තරකාර සමාගමේ සාමාන්‍යාධිකාරී ඩැනියෙල් ලුඩ්වික් මහතා ලේඛන කීපයක් සලකුණු කර ඇතත් ඔහුගේ සාක්ෂි අවසන් කර නැති බැවින් පරීක්ෂණය 2016.11.21 දින ප. ව. 2.00ට කල් තබන ලදී. ඉන් පසුව වගඋත්තරකරු සාක්ෂිකරුගේ සාක්ෂිය අවසන් නොකර ඇති බැවින් ඉල්ලුම්කාර පාර්ශවය ද ඊට විරෝධතාවය පළ කිරීමක් නිසා විභාගය 2017.01.05 දින සහ 2017.01.30 දිනට කල් තබන ලදී. ඉන්පසු පරීක්ෂණය අඛනින්දේ පැවති අතර වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අවසන් කිරීමෙන් පසු වගඋත්තරකාර පාර්ශවයේ සාක්ෂි 2017.07.28 වැනි දින අවසන් කරන ලදී.

2017.08.13 දින ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් සුජීව සුහසිංහ මහතා ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් සේවක ලේනාගොඩ තුෂාර චමින්ද ප්‍රනාන්දුගේ සාක්ෂිය මෙහෙයවන ලදී. එම සාක්ෂිය අවසන් කිරීමට පෙර වගඋත්තරකාර සමාගමේ නීතිඥ අදීල් කාසිම් මහතා මෙම පරීක්ෂණය සමථයකට පත් කිරීමට තමන්ට උපදෙස් ලැබී ඇති බවත් එම සමථ යෝජනාව ප්‍රකාරව සේවකයින්ට දීමනාවක් ගෙවීමට තීරණය කර ඇති බවත් එම දීමනාව අධිකරණය ඉදිරියේ දී ලබා දීමට ද හැකියාවක් ඇති බවත් දක්වන ලදී.

ඉල්ලුම්කාර පාර්ශවයේ නියෝජිත සුජීව සුහසිංහ මහතා ද කැමැත්ත පළ කළ බැවින් 2017.12.08 දින ප. ව. 3.00ට දෙපාර්ශවයේ එකඟත්වයෙන් සමථ යෝජනා එදින විමසා අධිකරණයට ඉදිරිපත් කරන බව දැන්වී ය. මේ අනුව අවසන් වශයෙන් මේ සමථය සඳහා සාකච්ඡා කොට තීරණයක් ගැනීම සඳහා 2018.02.14 ප. ව. 2.00ට කල් තබන ලදී.

2018.02.14 වැනි දින වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥතුමා පැමිණ නොසිටිය ද 2017.10.23 වැනි දින වගඋත්තරකාර සමාගම සමථය අනුමත කර තිබුණ බැවින් සමථය සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කොට පිටු 08 කින් යුත් ලේඛනයක් බේරුම්කරණය වෙත භාරදෙන ලදී. එම ලේඛනයට සෙරඩිබ් සමාගමේ Chief Operating Officer කෙනෙකු විසින් ද සමාගමේ ශාඛාව වෙනුවෙන් ලාල් ප්‍රනාන්දු යන කෙනෙකු ද පයරන්ට් යූනියන් වෙනුවෙන් නිලධාරී කෙනෙකු ද අත්සන් කර ඇත. තවද අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ මහතා විසින් අත්සන් කරන ලද 2017.12.12 දිනැතිව ලියවිල්ලකට ද අත්සන් තබා ඇත.

මේ අනුව සේවකයින් 21 දෙනෙකු සම්බන්ධයෙන් සහ සීමාසහිත සෙරන්ඩිබ් ලෙෂර් මැනේජ්මන්ට් ලිමිටඩ් මෙම සමථය ක්‍රියාත්මක වී ඇති බැව් මගේ පිළිගැනීමයි.

**නීතිඥ ටී. පියසෝම,**
බේරුම්කරු.

2018 මාර්තු මස 10 වැනි දින,

08 - 90